**පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය - 2020**
**-------------------------------------------------------------------------**

**පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 සැප්තැම්බර් 05 දින එළඹි අංක 5792- එල්කේ දරන ණය ගිවිසුමේ 2 (ආ) (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**
**-----------------------------------------------------------------------------------**

**ණය ගිවිසුම අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ.**

**ශ්‍රී ලංකාවේ තෝරාගත් ස්ථානයන්හි සංරක්ෂණ අරමුණු හා ප්‍රජාවේ ප්‍රතිලාභ සඳහා පරිසර පද්ධති කළමනාකරණ තත්ත්ව වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. නියමු භූ දර්ශන සැළසුම් කිරීම හා කළමනාකරණය, ස්වාභාවික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම හා අලි-මිනිස් සහජීවනය, රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සහ ආයතනික ධාරිතා හා ව්‍යාපෘති කළමනාකරණය යන ප්‍රධාන සංරචක 04 යටතේ මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ.**
**ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 7,827.3කට සමාන ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 45 ක් වූ අතර, මුළු මුදලම ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් මූල්‍යායනය කිරීමට එකඟත්වය පළ කර ඇත. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2021 ජුනි 30 දින වන විට එය නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2022 ජුනි 30 දක්වා කාලය දීර්ඝ කර තිබුණි.**

**1.3 මතය**
**-------**

**ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**
**---------------------**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්**
**----------------------------------------------------------------------------------------------------**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,**

- **ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.**

- **අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.**

- **භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.**

- **මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.**

**මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.**

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩු/ විගණන නිරීක්ෂණ | වටිනාකම රු. | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මුළු ව්‍යාපෘති වියදම රුපියල් 1,157,591,574ක් ලෙස | 28,644,077 | වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ අවසන් ගිණුම්වල 2020 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම ලෙස සඳහන් කර ඇති මුදල රු. 1,128,947,497 කි. ප්‍රතිපූරණය | ඒ අනුව සංසන්දනය කර සැසඳුම් සකස් කළ යුතුය. |

| | |
|---|---|
| පෙන්වා ඇති අතර ඊට අනුරූප වියදම රුපියල් **1,128,947,497**ක් ලෙස වනජීවී හා සංරක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. කෙසේ වෙතත්, වෙනස්කම් හඳුනා ගැනීමට සැසඳුම් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සහ අත්තිකාරම් පියවීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යවන ලද ආපසු ඉල්ලීමේ අයදුම්පත්වලට **2020** වර්ෂය සඳහා දරන ලද වියදම්, **2019** දෙසැම්බර් මාසයේදී දරන ලද වියදම් සහ **2019** වසරේ ලැබුණු අත්තිකාරම් පියවීම් ඇතුළත් වේ. එබැවින්, අමාත්‍යාංශය විසින් ගණනය කරන ලද වියදම, වර්ෂය තුළ ව්‍යාපෘතිය මගින් දරන ලද සැබෑ වියදම්වලට සමාන නොවේ. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුගත නොවීම්/ විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතේ **2.1.1.** | මෙහෙයුම් කමිටු රැස්වීම කාර්තුමය වශයෙන් පැවැත්විය යුතු වුවද, **2020** වසර සඳහා ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට එවැනි කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | නොවැළැක්විය හැකි තත්ත්වයන් යටතේ **2020** වසරේ කිසිදු ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීමක් පැවැත්වීමට ව්‍යාපෘතියට නොහැකි විය. අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙහෙයුම් කමිටුවේ සභාපතිවරයා වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අදාළ වර්ෂය තුළ මෙහෙයුම් කමිටුවේ සභාපතිත්වය දැරීමට නියමිත අමාත්‍යාංශ ලේකම්වරුන් තිදෙනෙකු සහ මීට පෙර නම් කළ සාමාජිකයින් බොහෝ දෙනෙකු ස්ථාන මාරු කිරීම හෝ වෙනත් තනතුරුවලට උසස් කිරීම නිසා කාරක සභාව නැවත පත්කිරීම හේතුවෙන් නාමයෝජනා භාරදීමේ ප්‍රමාදයන් ඇති විය. තවද, කොවිඩ්-**19** තත්ත්වය ද මීට හේතුවක් විය. | අදාළ රැස්වීම් නියමිත වේලාවට පැවැත්විය යුතු අතර අරමුණු සහ කාල ඉලක්කයට අනුව ව්‍යාපෘති කාර්ය සාධනය සමාලෝචනය කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචක | ක්‍රියාකාරකම | 2020 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | ළඟා කරගත් කාර්යසාධනය ප්‍රතිශතය | | | |
| (i) 2(අ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් | 100 | 5 | පහළ මට්ටමේ ප්‍රගතිය | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යාල සහ උඩවලව උද්‍යාන ආශ්‍රිතව ජීවත් වන ප්‍රජාවන් සඳහා 2(අ) සංරචකය යටතේ ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් සහ කෘෂිකර්මාන්තය සඳහා ජල සම්පාදන කටයුතු කිහිපයක් දියත් කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, COVID-19 වසංගතය හේතුවෙන්, 2020 වර්ෂය තුළ සමහර ප්‍රදේශ වසා දමා ඇති අතර සංචරණ සීමා ද පනවන ලදී. | ඒ අනුව අදාළ කටයුතු ක්‍රියාත්මක කල යුතුයි. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ii) | 3 (ඇ) | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් | 100 | 10 | පහළ මට්ටමේ ප්‍රගතිය. | උප සංරචක 3(ඇ) යටතේ ක්ෂේත්‍ර පුහුණු පැවැත්වීමට දෙපාර්තමේන්තු සඳහා ප්‍රතිපාදන සපයා ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විවිධ ක්ෂේත්‍ර මට්ටමේ පුහුණුවීම් සඳහා මුදල් වැය කිරීමට සැලසුම් කර ඇතත්, COVID-19 වසංගතය හේතුවෙන් සැලසුම් කල පරිදි පුහුණුවීම් පැවැත්වීමට සහ මුදල් වියදම් කිරීමට නොහැකි විය. | ඒ අනුව අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුවේ. |
| (iii) | 2 (ආ) | ජීවනෝපාය ආරක්ෂාව සඳහා අලි මිනිස් සහජීවනය | 100 | 55 | සමස්ත භෞතික ප්‍රගතිය පහළ මට්ටමක පැවතුනි. | 2020 වර්ෂය තුළදී උප සංරචක 2බී යටතේ කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ගම් අලි වැට සහ කන්න කුඹුරු වැටවල් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, COVID-19 වසංගතය හේතුවෙන් දිස්ත්‍රික්ක දෙකෙහිම වැඩසටහන තාවකාලිකව නතර කිරීමට නිලධාරීන්ට සිදු විය. අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ මිලදී ගෙන තිබුණද, මහජන සෞඛ්‍ය නිළධාරීන් සහ ග්‍රාම නිලධාරී විසින් අදාළ ප්‍රදේශවල ක්ෂේත්‍ර චාරිකා තහනම් කර තිබූ බැවින් ප්‍රජා සහභාගීත්වය ලබා ගත නොහැකි විය. වැඩසටහනේ ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රධාන දුෂ්කරතාවය මෙය විය. මීට අමතරව, මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය 3 (ආ)හි ප්‍රගතිය කෙරෙහි විශාල බලපෑමක් ඇති කළ අතර 2020 ජූලි 08 දින නිකුත් | ඒ අනුව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුවේ. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රුපියල් මිලියන 120 ක් වටිනා ප්‍රධාන ඉදිකිරීම් 3 ක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියට බාධාවක් විය. 2020 දෙසැම්බර් 28 වැනි දින කැබිනට් පත්‍රිකාව මගින් මේවා ඉවත් කරන ලද අතර 2020 ජූලි මාසයේ සිට මූල්‍ය හෝ භෞතික ප්‍රගතියක් අත්කර ගැනීමට නොහැකි විය. | |
| (iv) | 3 (ආ) | ආරක්ෂිත ප්‍රදේශවල ස්වභාවධර්මය පදනම් කරගත් සංචාරක ව්‍යාපාරය | 100 | 52 | සමස්ත භෞතික ප්‍රගතිය පහළ මට්ටමක පැවතුනි. | - එම - | ඒ අනුව අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කල යුතුය. |
| (v) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ සැලසුම් කර ඇති ක්‍රියාකාරකම්වල සාමාන්‍ය භෞතික ප්‍රගති අගය | | 100 | 47 | ප්‍රගතියේ පහළ මට්ටම | දෙපාර්තමේන්තු දෙකම විසින් ක්‍රියාත්මක කරන සියලුම සංවර්ධන ක්‍රියාකාරකම් ඔවුන්ගේ රක්ෂිත ප්‍රදේශ හෝ උද්‍යාන අවට තෝරාගත් ගම්මාන තුළ පිහිටා ඇත. වත්මන් ක්‍රියාකාරකම් 2019 සහ 2020/2021 කාලය තුළ සැලසුම් කර ඇති අතර කාර්යසාධනය ද විවිධ පරිමාණයන්ගෙන් වේ. මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද (2020 ජූලි 08 දිනැති) චක්‍රලේඛය හේතුවෙන් වැඩසටහන් ක්‍රියාකාරකම් 50 ක් තාවකාලිකව | ඒ අනුව ක්‍රියාකාරකම් ඉටු කල යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | අත්හිටුවන ලදී. සංවර්ධන කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් **2020.12.28** දින අනුමැතිය ලබා දෙන ලදී. මෙම නතර කිරීම මාස හයක් තරම් දිගු වූ අතර එය ප්‍රගතියට අහිතකර ලෙස බලපාන ලදී. | |
| **(vi)** | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ සැලසුම් කර ඇති ක්‍රියාකාරකම්වල සාමාන්‍ය භෞතික ප්‍රගති අගය | **100** | **59** | පහළ මට්ටමේ ප්‍රගතිය | - එම - | - එම - |
| **(vii)** | ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය | **100** | **65** | පහළ මට්ටමේ ප්‍රගතිය | වත්මන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම **2019** සිට දෙපාර්තමේන්තු දෙකක ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. **2017** සහ **2018** දී නිම කරන ලද වැඩ වත්මන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මේ ඇතුළත් කර නොමැති බැවින්, ප්‍රගතිය **65** ප්‍රතිශතයක් ලෙස අඩුවෙන් පෙන්වයි. **3.1.iv** හි දක්වා ඇති පරිදි, **2020** ජූලි **08** දින භාණ්ඩාගාර චක්‍රලේඛය මාස හයක ප්‍රමාදයක් සහ අඩු භෞතික ප්‍රගතියක් සඳහා ප්‍රධාන හේතුව විය. ප්‍රමාදය හසුකර ගැනීමට කටයුතු සම්පාදනය කර ඇති අතර වැඩි දියුණු කළ ප්‍රගතිය නියමිත වේලාවට ඉදිරිපත් කළ හැකිය. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුවේ. |

## 3.2 කොන්ත්‍රාත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘති ණය ගිවිසුමේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 45ක් වන අතර 2020 වනවිට එය ඇමෙරිකානු ඩොලර් මිලියන 35 දක්වා පහත බැස තිබෙන අතර ව්‍යාපෘතිය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් 544ක් සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 53.8ක් වෙන් කර තිබුණි. සමස්ත ව්‍යාපෘති පිරිවැය ඉක්මවන යථාර්ථවාදී නොවන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇති බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය අවසානයේ මෙම සැලැස්ම යටතේ රු. මිලියන 27ක් වටිනා ව්‍යාපෘති ක්‍රියාකාරකම් 299ක් අවලංගු කර තිබුණි. ඒ අනුව, ව්‍යාපෘති සැලසුම් සකස් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ දුර්වල කළමනාකරණය හේතුවෙන් මුළු සැලැස්මෙන් සියයට 54.96ක් අවලංගු කර ඇති බව නිරීක්ෂණය විය.<br><br>මේ හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවල ප්‍රමාණය හා ගුණාත්මක බව පිළිබඳ විගණනයට අනුව සෑහීමකට පත්විය නොහැකි විය. | ව්‍යාපෘතියෙහි ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක වන්නේ ලෝක බැංකුව විසින් හඳුන්වා දුන් 'STEP' යන මාර්ගගත පද්ධති ඇමතුම සමඟිනි. ක්‍රියාත්මක කරන ආයතන දෙක ඇස්තමේන්තුගත වියදම් සහිත සංවර්ධන ක්‍රියාකාරකම්ඉදිරිපත් කරන අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් STEP පද්ධතියට පෝෂණය කරයි. පිරිවැය ඇතුළත් කිරීමට සීමාවන් හෝ උපරිමයක් නොමැති අතර සමහර විට එය මුළු ව්‍යාපෘතියේ අයවැය වන ඩොලර් මිලියන 35 ඉක්මවා යා හැකිය. කෙසේ වෙතත්, සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම්වල පිරිවැය සහ දැනට පවතින ඉදිකිරීම් සඳහා වැය වන මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 35ක අයවැය නොඉක්මවනු ඇත. දෙපාර්තමේන්තු දෙකක් විසින් සපයනු ලබන තොරතුරු මත පදනම්ව ප්‍රසම්පාදන සැලැස්මට සියලුම ක්‍රියාකාරකම් ඇතුළත් ය. නමුත් ක්‍රියාත්මක කරන ආයතනවල ප්‍රමුඛතා වෙනස්වීම් අනුව මෙම ඇතුළත් කිරීම් වෙනස් කළ හැක. පසුගිය කාලයේ මේ ක්‍රමයේ විශාල වෙනස්කම් සිදු විය. නමුත් එම තත්ත්වය පාලනය කර ඇති අතර අතීතයට සාපේක්ෂව දැන් සිදු වන්නේ වෙනස්කම් කිහිපයක් පමණි. | ප්‍රසම්පාදයන්න නිවැරදිව හඳුනාගෙන වරින් වර සමාලෝචනය කළ යුතුය. |

**3.3 මතභේදාත්මක ස්වභාවයේ කරුණු**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ වලංගු ගිවිසුමකින් තොරව රාජ්‍ය දැව සංස්ථාවට අයත් ගොඩනැගිල්ලක ව්‍යාපෘති කාර්යාලය ස්ථාපිත කර ඇත. | රාජ්‍ය දැව සංස්ථාවට අයත් වන ‘සම්පත්පාය’ හි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් භාවිතා කරන සත්‍ය ප්‍රදේශය සහ ගිවිසුමේ දක්වා ඇති ප්‍රදේශය අතර යම් යම් විෂමතා තිබුණි. මෙම විෂමතාවය ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණක විසින් නවතම මිනුම් සමඟ නිවැරදි කරන ලද අතර වත්මන් ගිවිසුම නිවැරදි කරන ලෙස ඉල්ලා සිටින ලදී. ඒ අනුව, අදාළ තොරතුරු ඉල්ලා සහ ප්‍රතිචාර බලාපොරොත්තුවෙන් තවත් ආයතන දෙකකට (ව්‍යාපෘතියේ නොවන නමුත් එම පරිශ්‍රයේම පිහිටා ඇති) ලිපි යවා ඇත. රාජ්‍ය දැව සංස්ථාව සමඟ සාකච්ඡා දිගටම කරගෙන යන අතර නිවැරදි මිනුම් සහ තොරතුරු සමඟ නව ගිවිසුම අවසන් කිරීමෙන් පසුව ගෙවීම් සිදු කරනු ලැබේ. | ගිවිසුමට ඇතුළත් විය යුතුය |

**3.4 මානව සම්පත් කළමනාකරණයට අදාළ ගැටළු**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ අනුමත කාර්ය මණ්ඩල තනතුරු 05ක් සඳහා පුරප්පාඩු 06ක් තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වරින් වර සමාලෝචනය කළ යුතුය. |

**3.5 කොන්ත්‍රාත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| i සංරචක 01- භූ දර්ශන පදනම් වූ සැලසුම් සහ කළමනාකරණ සංරචකය යටතේ සංශෝධිත ඇස්තමේන්තුව මගින් හඳුන්වා දුන් රුපියල් මිලියන 117 වටිනා භූ දර්ශන සැලසුම් දෙකක්, සම්පූර්ණ කර නොතිබුණි. | පළමු සංරචකයේ භූ දර්ශන කළමනාකරණ සැලසුම්වල සැබෑ මෙහෙයුම් කටයුතු 2017 ජූනි මාසයේදී ආරම්භ කරන ලදී. හුරුළු - කවුඩුල්ල - කන්තලේ (HKK) කලාපය (හෙක්ටයාර 530,000) - මෙය පළමු භූ දර්ශන කළමනාකරණ සැලසුම් සඳහා කලාපය වූ අතර කළමනාකරණය, ආරක්ෂාව, පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ මූලික අධ්‍යයනයන් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී. ඉන් අනතුරුව, අංශ තුනක් පිළිබඳ | ඒ අනුව ක්‍රියාකාරකම සම්පූර්ණ කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | සවිස්තරාත්මක පර්යේෂණ කටයුතු සඳහා විශේෂඥයින් තිදෙනෙකු යොදවන ලදී. අවශ්‍ය තොරතුරු රැස්කර ඇත. මෙම තොරතුරු සහ දත්ත මත පදනම්ව, හුරුළු - කවුඩුල්ල - කන්තලේ සඳහා වන පළමු භූ දර්ශන කළමනාකරණ සැලස්ම ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් 2019 දී 'TEAMS Consultants' විසින් සංවර්ධනය කර සම්පූර්ණ කරන ලදී. සිංහරාජ වන රක්ෂිතය සඳහා වන දෙවන භූ දර්ශන කළමනාකරණ සැලස්ම - 2019 ඔක්තෝම්බර් මාසයේදී මෙම කාර්යය සඳහා උපදේශකයින් තෝරා ගැනීම සඳහා විවෘත ටෙන්ඩර් කැඳවන ලද අතර 2020 පෙබරවාරි මාසයේදී ගිවිසුම් අත්සන් කරන ලදී. මෙම උපදේශක කණ්ඩායම විදේශීය නායක උපදේශකයෙකු සමඟ දේශීය විශේෂඥයින් හත් දෙනෙකුගෙන් සමන්විත විය. එම HKK ක්‍රියා පටිපාටියම කලාප, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් අනුගමනය කරන ලදී. 2021 ජූනි වන විට, මෙම අභ්‍යාසයේ වැඩවලින් 95% කට ආසන්න ප්‍රමාණයක් අවසන් වූ අතර 2021 අගෝස්තු වන විට සිංහරාජ වන රක්ෂිතය සඳහා භූ දර්ශන කළමනාකරණ සැලස්ම සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත. මුල් සැලැසුම්වලට අනුව, මෙය 2021 මාර්තු 15 වන විට අවසන් කළ යුතුව තිබූ නමුත් මෙම මාස හයක ප්‍රමාදය සඳහා COVID-19 තත්ත්වය බලපෑවේය. | |
| ii | ව්‍යාපෘති ගිවිසුමට අනුව සංරචක අංක 01 සඳහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස හඳුනාගෙන තිබූ තිරසර සංවර්ධන ලේකම් කාර්යාලය විගණිත කාලය වන විටත් ඉහත කී කාර්යයට සක්‍රීය දායකත්වයක් ලබා දී නොතිබුණි. | තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතේ තිරසාර සංවර්ධන ලේකම් කාර්යාලය ක්‍රියාත්මක වන අතර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ද එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. නමුත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මහවැලි හා පරිසර සංරක්ෂණ අමාත්‍යාංශය යටතේ පැවති අතර ESCAMP ද එම අමාත්‍යාංශය | නිවැරදි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | යටතේ ක්‍රියාත්මක විය. තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් 2017, 2018 සහ 2019 වර්ෂවල සියලුම ප්‍රගති සමාලෝචන රැස්වීම්, මෙහෙයුම් කමිටු රැස්වීම් සහ තාක්ෂණික කමිටු රැස්වීම්වලදී පවා නියෝජනය කර ඇත. අවසානයේ තිරසාර ලේකම් කාර්යාලය නිසියාකාරව ක්‍රියාත්මක නොවූ අතර පසුව අමාත්‍යාංශය ද වෙනස් විය. 2020 වසරේ සිට, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය යටතේ පළමු සංරචකය සාර්ථකව ක්‍රියාත්මක විය. ලෝක බැංකුවේ කැමැත්ත ඇතිව මෙම වැඩපිළිවෙළ සකස් කර ඇත. | |
| iii | තෙත් කලාපීය සහ වියළි කලාපීය භූ දර්ශන සැලසුම් සකස් කිරීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට සහ අවශ්‍ය නෛතික අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ආයතනික පසුබිම විගණිත දිනය වන විටත් ලබාගෙන නොතිබුණි. | 2020 අප්‍රේල් මාසයේ ලෝක බැංකු මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් කිහිපයකට පසුව, LMP කලාප සඳහා කමිටු පත් කරන ලෙස වනජීවී හා වන සංරක්ෂණ ලේකම් වෙත ඉල්ලීමක් කිරීමට බැංකුව තීරණය කර ඇත. ඒ අනුව, බැංකුව 2021 මැයි මස මුලදී අමාත්‍යාංශයට ඉල්ලීමක් යවා ඇත. අවශ්‍ය අනෙකුත් පියවර ඉදිරියේදී ගනු ලැබේ. | ආයතනික රාමුව සකස් කළ යුතුයි. |
| iv | භූ දර්ශන සැලසුම් සහ කළමනාකරණයට අවශ්‍ය සංවර්ධනය නොකරන කලාප හඳුනා ගැනීම සහ ගැසට් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි විගණිත දිනය වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | HKK සහ SFR සැලසුම් සිතියම් තුළ විවිධ කලාප ඇතුළත් කර ඇති අතර එම නිසා සංවර්ධනය නොකරන කලාප ප්‍රකාශ කිරීමට වෙනම ගැසට් නිවේදන අත්‍යවශ්‍ය නොවේ. | නියමිත වේලාවට සම්පූර්ණ කළ යුතුය. |
| v | ව්‍යාපෘති සංරචකය 2බී - අලි-මිනිස් සහජීවනය සඳහා වන පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ගම්මාන දෙකක පරීක්ෂාවට ලක් කළ නමුත් ව්‍යාපෘති අරමුණ සාක්ෂාත් කර ගැනීමට එය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. | 'අලි පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය' ප්‍රජා පාදක විදුලි වැටවල් සඳහා අතිරේක නියමු පදනමක් මත සංවර්ධනය කරන ලදී. ඒ අනුව තෝරාගත් ස්ථාන කිහිපයක පමණක් මෙම ක්‍රමය පරීක්ෂාවට ලක් කෙරෙන අතර සාර්ථකත්වය හෝ ප්‍රතිඵල මත මෙය තවත් ප්‍රදේශවලට ව්‍යාප්ත කළ හැකිය. තවදුරටත් පුළුල් කිරීම සඳහා අරමුදල් නියෝජිතායතනයේ අනුමැතිය ද අත්‍යවශ්‍ය වේ. මෙම | ක්‍රියාකාරකම් තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ක්‍රියාකාරකම මුල් යෝජනාවට ඇතුළත් කර නොතිබූ අතර ITI නියමු වැඩසටහනේ ධනාත්මක ප්‍රතිඵල මත අනෙකුත් අනාගත ක්ෂේත්‍ර සඳහා ද පද්ධතිය හඳුන්වා දීමට හැකියාව ඇත. | |
| **vi** | ව්‍යාපෘති සංරචකය 2B යටතේ ගම්වැට 47ක් සහ කෘෂි වැටවල් 60ක් ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇති අතර සමාලෝචිත වර්ෂය තුළ ග්‍රාමීය වැටවල් 30ක් සඳහා අවශ්‍ය උපකරණ රු.මි. මිලියන 40.82කට මිලදී ගෙන තිබුණි.. කෙසේ වෙතත්, සැලැස්මට අනුව වසර අවසන් වන විට නිම කළ ගම්මාන සහ කෘෂි වැටවල් පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | ව්‍යාපෘතිය යටතේ සැලසුම් කළ ගම් වැටල් ගණන 47 කි. (කුරුණෑගලින් 25ක් ද අනුරාධපුරය සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල 22ක්). 2020 වසර අවසන් වන විට වැටවල් නවයක් නිම කර ඇති අතර තවත් වැටක් කුරුණෑගල අවසන් වෙමින් පවතී. තවත් වැටවල් හයක ඉදිකිරීම් ද ආරම්භ විය. අනුරාධපුර වැටවල් කිහිපයක් ඉදි කිරීමේ මූලික කටයුතු ආරම්භ කරන ලද අතර ඉදිකිරීම් කටයුතු කළ යුතුව පවතී.<br><br>සැලසුම් කළ කෘෂිකාර්මික (කුඹුරු) වැටවල් හැටකි. (සෑම දිස්ත්‍රික්කයකම වැටවල් තිහක්). නමුත් මෙතෙක් දිස්ත්‍රික්ක දෙකෙහිම එක කෘෂි වැටක්වත් ඉදිකර අවසන් කර නොතිබුණි. (වැට සඳහා උපකරණ මිලදී ගැනීම ආරම්භ කරන ලද අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා කෘෂිකාර්මික වැටවල් සඳහා යෝජනා කැඳවන ලදී). | ව්‍යාපෘතියේ අරමුණු නියමිත කාල සීමාව තුළ සාක්ෂාත් කරගත යුතුය. |